# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 3 දරන ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 1981 ජනවාරි මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජනවාරි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි | තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 3 දරන ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1981 ජනවාරි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 93/79.

### ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එකී ආයතනයට සම්බන්ධ සියලු කරුණු, මූලධර්ම, පිළිවෙත් සහ ශිල්පීයක්‍රම වැඩිදියුණු කිරීම සඳහාත්, එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ අතුරු ව්‍යවස්ථා අනුව, ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහාත් එක් දහස් නවසිය හැත්තෑ දෙවන වර්ෂයේ දී පිහිටුවනු ලැබූ හෙයින් ද: *පූර්විකාව.*

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කිපය එකී ආයතනය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ ඒ ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපතට ඉවහල් වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1981 අංක 3 දරනු ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ දැනට සංස්ථාගත සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙසින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සංස්ථාගත සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (ඔවුන් සංස්ථාගත සාමාජිකයන් ලෙස සිටින තාක් කල්) මේ පනත ආරම්භවීමේ දින සිට හා ඉන් පසු, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් වී, එසේ පැවතිය යුතු ය. එකී නාමයෙන් සියලු අධිකරණයන්හි එය විසින් නඩු පවරනු ලැබීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ සංස්ථාවේ අභිමතය හා කැමැත්ත පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. *සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම.*

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ මෙහි පහත ප්‍රකාශිත පොදු පරමාර්ථ පිණිස වේ:— *සංස්ථාවේ පොදු පරමාර්ථ.*

(අ) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ මූලධර්ම, ශිල්පීය ක්‍රම, පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම;

(ආ) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පත්‍රිකා කියවීම සඳහා සහ ඒ හා සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම සඳහා නිතිපතා රැස්වීම් පැවැත්වීම;

(ආ) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයෙහි වැඩ කටයුතු වලට බලපාන සැපයුම් කටයුතු පිළිබඳ ක්‍රියාකාරිත්වය ගැන පර්යේෂණ භාර ගැනීම සහ ශිල්පීයක්‍රම වැඩිදියුණු කිරීම හා යම් සංවර්ධනයක් පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීම ;

(ඇ) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණයෙහි නියුක්ත තැනැත්තන්ගේ දැනුම පෘථුල කිරීමේ අදහසින් ශ්‍රී ලංකාවෙහි හෝ ඉන් පිටත, සම්මේලන, සම්මන්ත්‍රණ, ප්‍රසිද්ධ දේශන සහ සමූහ අධ්‍යයනය ආරම්භ කිරීම, ඒවා සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ඉ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමේ පාඨමාලා සහ විභාග පැවැත්වීම සහ සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණයෙහි නියුක්ත තැනැත්තන්ගේ ප්‍රවීණතාව පරීක්ෂා කර බැලීම සහ ප්‍රවීණතා සහතික ප්‍රදානය කිරීම ;

(ඊ) විවිධ සාමාජික ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම තක්සේරු කිරීම ;

(උ) සංස්ථාවේ සාමාජිකයන්ගේ සහ ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත මහජනයාගේ හෝ ඉන් යම් කොටසක යහපත පිණිස සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා විද්‍යාල, ආයතන, ශාස්ත්‍රාල, පුස්තකාල හෝ පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, නඩත්තු කිරීම හෝ ඊට ආධාර දීම හෝ පවත්වා ගෙන යාම ;

(ඌ) සංස්ථාවට විශේෂ වැදගත්කමක් ඇති විෂයයන් පිළිබඳ අධ්‍යයන කටයුතු කිරීමට සංස්ථාවේ සාමාජිකයන්ට අවස්ථා සලසා දීම සහ හැකි අවස්ථාවල දී ඒ අධ්‍යයන කටයුතු පළ කිරීම සඳහා සංවිධානය කිරීම ;

(එ) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණයෙහි නියුක්ත සියලු තැනැත්තන් අතර වෘත්තීය පැවැත්ම පිළිබඳ උසස් චර්යාධර්ම පද්ධතියක් ඇති කොට ක්‍රියාත්මක කිරීම ;

(ඒ) නවීන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි කාර්යක්ෂම ලෙස මිල දී ගැනීම්, සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැදගත්කම ගැන පුළුල් පිළිගැනීමක් ලබා ගැනීම සහ ඒ පිළිබඳව වෘත්තීය තත්ත්වය වැඩිදියුණු කිරීම සහ රජයේ ව්‍යාපාර, කාර්මික ව්‍යාපාර ආයතන හෝ සමාගම් සඳහා මිල දී ගැනීම් වල සහ සැපයුම්වල නියුක්ත තැනැත්තන් අතර ආශ්‍රය සහ මිත්‍ර සම්බන්ධතා ඇති කිරීම ;

(ඔ) ශ්‍රී ලංකාවේ සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැදගත්කම ගැන මහජන උනන්දුව ඇති කිරීම සහ ඒ වැදගත්කම ගැන මහජන අවබෝධය ප්‍රගුණ කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල්වල සමාන හෝ සමාන්තර සම්බන්ධතා ඇති සංගම් සමඟ සම්බන්ධකම් ඇති කර ගැනීම, ප්‍රගුණ කිරීම සහ පවත්වා ගෙන යාම ; සහ

(ඬ) ඉහත කී පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික හෝ ඉවහල් වන වෙනත් සියලුම ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සේව පිරිස් නියුක්ත කර ගැනීමේ, සේවයෙහි නියුක්ත කිරීමේ සහ පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සභාපතිගෙන් ද, උපසභාපතිවරු තිදෙනාගෙන් ද, ලේකම්ගෙන් ද, භාණ්ඩාගාරිකගෙන් ද, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා අතුරු ව්‍යවස්ථාවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ අතුරු ව්‍යවස්ථා අනුව තෝරා පත් කර ගනු ලබන වෙනත් තැනැත්තන්ගෙන් ද සමන්විත සභාවක් මගින් සංස්ථාවේ කටයුතු, එකී අතුරු ව්‍යවස්ථාවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ධුර දරන ආයතනයේ සභාව සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතු ය.

සංස්ථාවේ අතුරු ව්‍යවස්ථා.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී, ඡන්දය දෙන සාමාජිකයන්ගේ අවශ්‍ය වැඩි ඡන්දයෙන් සංස්ථාව විසින්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන අතුරු ව්‍යවස්ථා කලින් කල සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එවැනි අතුරු ව්‍යවස්ථා සාදන ලද විට, එවැනි ම සභා රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම ද ඒවාට යමක් එකතු කිරීම ද ඒවා සංශෝධනය කිරීම ද පරිච්ඡින්න කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි බල පවත්නා ආයතනයේ අතුරු ව්‍යවස්ථා මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ අතුරු ව්‍යවස්ථා ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා මේ පනත යටතේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ අතුරු ව්‍යවස්ථාවලට යටත් විය යුතු ය.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බෙදා හැර කිරීමක් කරණකොටගෙන හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගෙන සතුව තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව හා ශක්තතාව ඇත්තේ ය. තව ද ඒ සියලු දේපළ, ඒවා විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට

හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා අතුරු ව්‍යවස්ථාවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් සංස්ථාව සතුව තබාගත යුතු ය.

ගාස්තු හා ග්‍රාහක මුදල් අයකර ගැනීමේ බලය.

8. සංස්ථාව—

(අ) සංස්ථාව විසින් පවත්වනු ලබන යම් විභාගයකට හෝ අධ්‍යයන පාඨමාලාවකට ඇතුළත් කර ගැනීම සඳහා සාධාරණ යයි සංස්ථාව සලකන ගාස්තු ;

(ආ) සංස්ථාවේ යම් සාමාජික ශ්‍රේණියකට තැනැත්තන් තෝරා ගැනීම සඳහා ගාස්තු ; සහ

(ඇ) සංස්ථාව විසින් සලසනු ලබන සේවාවන් සම්බන්ධයෙන් සාධාරණ යයි සංස්ථාව සලකන ග්‍රාහක මුදල් හා ගාස්තු සංස්ථාවේ සාමාජිකයන්ගෙන්

අය කර ගැනීමට නීතියෙහි ලා හැකියාව හා ශක්තතාව ඇත්තේ ය.

විනය පාලක කාරක සභා.

9. ශ්‍රී ලංකාවේ මිල දී ගැනීම්, සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරුවන් ලෙස වෘත්තියේ යෙදී සිටින හෝ ක්‍රියා කරන තැනැත්තන් අතර විනය පාලනය කිරීම සඳහා විනය පාලන කාරක සභා පත් කිරීමට සහ කලින් කල අවශ්‍ය යයි පෙනී යන වෙනත් පියවර ගැනීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

ආයතනයෙන් අයවිය යුතු ණය සහ ආයතනයට ගෙවිය යුතු ණය.

10. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවතින ආයතනයේ සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, ආයතනයට අය විය යුතු සියලු ණය සහ ආයතනයට ලැබිය යුතු ග්‍රාහක මුදල්, දායක මුදල් සහ ගාස්තු සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.

11. සභාවේ බලය ඇතිව සහ සභාවේ සාමාජිකයන් දෙදෙනකු සහ තත් කාර්යය සඳහා සභාව විසින් පත් කරනු ලබන පරිදි වූ තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නො තැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටිය බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද, එසේ අත්සන් කිරීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් කරන අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාපිත හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොයැවීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.